# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 413/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 09/03/2024<br>පැය 0910 |

## මාධ්‍ය නිවේදනය

**"ඇයට ශක්තිය දැයට ප්‍රගතිය" තේමාව යටතේ ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව සංවිධානය කරන ලද වැඩසටහන - පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය.**

2024.03.08 වන දිනට යෙදුනු ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව "ඇයට ශක්තිය දැයට ප්‍රගතිය" යන තේමාව යටතේ ළමා හා කාන්තා අපයෝජන නිවරණ කාර්යාංශය හා කාන්තා පිහිට ආයතනය මගින් සංවිධානය කළ වැඩසටහනක් කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශයේ නියෝජ්‍ය පොලිස්පති රේනුකා ජයසුන්දර මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2024.03.08 වන දින කොළඹ බිෂොප් විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

මෙම වැඩසටහන සඳහා කොළඹ දිසාවේ සියලුම කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරිණියන්ද දෙමටගොඩ හා කොළොන්නාව ප්‍රදේශ වල කාන්තා බල ගැන්වීමේ සංවිධානයේ සාමාජිකාවන් ඇතුළු පිරිසක්ද සහභාගී විය. එහිදී වර්ථමානයේදී කාන්තාවන් මුහුණ දෙන අභියෝග හා එම අභියෝග ජයගන්නා ආකාරය පිළිබඳව වැඩසටහනක් පවත්වන ලදී.

මෙම වැඩසටහන සඳහා කාන්තා පිහිට ආයතනයේ සභාපතිනී සාවිත්‍රී විජේසේකර මහත්මිය, නියෝජ්‍ය පොලිස්පති අපරාධ දිසාව හා පොලිස් මාධ්‍ය ප්‍රකාශක නීතිඥ නිහාල් තල්දූව මහතා ඇතුළු උසස් පොලිස් නිලධාරීන් රැසක් හා පොලිස් නිලධාරිනියන් පිරිසක් සහභාගී විය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**